ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2006 අංක 4 දරන ජිනීවා සම්මුති
පනත

[සහතිකය සටහන් කළේ 2006 පෙබරවාරි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2006 මාර්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු.17.50 යි. තැපැල් ගාස්තුව : රු.7.50 යි

2006 අංක 4 දරන ජිනිවා සම්මුති පනත

[සහතිකය සටහන් කළේ 2006 පෙබරවාරි මස 26 වන දින]

එල්. ඩී.— ඕ. 62/2004.

සන්නද්ධ ගැටුම් සහ මානවවාදී නීතිය පිළිබඳ පළමුවන, දෙවන, තෙවන සහ සිව්වන ජිනිවා සම්මුති ක්‍රියාවේ යෙදවීම සඳහා ද ඊ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

සන්නද්ධ ගැටුම් සහ මානවවාදී නීතිය පිළිබඳ පළමුවන, දෙවන, තෙවන සහ සිව්වන ජිනිවා සම්මුති 1959 පෙබරවාරි මස 28 වන දින දී අපරානුමත කර තිබීමෙන් ශ්‍රී ලංකාව ද එම සම්මුතියෙහි රාජ්‍ය පාර්ශ්වයක් වන හෙයින් ද : පූර්විකාව.

එකී ජිනිවා සම්මුති ශ්‍රී ලංකාවට අදාළව 1959 පෙබරවාරි මස 28 වන දින දී බලාත්මක වී තිබෙන හෙයින් ද :

එකී ජිනිවා සම්මුති යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ක්‍රියාවේ යෙදීම පිණිස ව්‍යවස්ථාමය විධිවිධාන සැලැස්වීම අවශ්‍යව තිබෙන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2006 අංක 4 දරන ජිනිවා සම්මුති පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

(2) පනතේ වෙන් වෙන් කොටස් ක්‍රියාත්මක වීම සඳහා වෙන් වෙන් දින නියම කරනු ලැබිය හැකි ය.

1 වන කොටස

ප්‍රාරම්භය

2. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වුව ද, නොවුව ද ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී හෝ මේ පනතේ I වන උපලේඛනයේ, II වන උපලේඛනයේ, III වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ ගෙනහැර සම්මුති බරපතළ ලෙස උල්ලංඝනය කිරීම වරදක් බව.

2-P L 000893 - 4,500 (2005/12)

දැක්වෙන සහ මේ වගන්තියේ (2) වන උපවගන්තියේ ද වෙන් වෙන්ව සඳහන් වන, සම්මුතියේ අදාළ වගන්තිවලට අනුව වූ බරපතල උල්ලංඝනයක්—

(අ) සිදුකරන හෝ සිදුකිරීමට තැත් කරන ; හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකු විසින් සිදුකිරීමට ආධාර දෙන, අනුබල දෙන, සිදුකිරීමට වෙනත් යම් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන හෝ වෙනත් යම් තැනැත්තකු ලවා සිදුකරවන,

යම් තැනැත්තෙක්, වරදක් කරන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා—

(අ) පළමුවන සම්මුතිය මගින් ආරක්ෂිත තැනැත්තන්ට හෝ දේපළවලට එරෙහිව සිදුකරන, ඒ සම්මුතියේ 50 වන වගන්තියේ සඳහන් ක්‍රියාවක් ඇතුළත්ව, ඒ සම්මුතිය උල්ලංඝනය කිරීමක් පළමුවන සම්මුතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් වන්නේ ය ;

(ආ) දෙවන සම්මුතිය මගින් ආරක්ෂිත තැනැත්තන්ට හෝ දේපළවලට එරෙහිව සිදු කරන, ඒ සම්මුතියේ 51 වන වගන්තියේ සඳහන් ක්‍රියාවක් ඇතුළත්ව, ඒ සම්මුතිය උල්ලංඝනය කිරීමක්, දෙවන සම්මුතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් වන්නේ ය ;

(ඇ) තෙවන සම්මුතිය මගින් ආරක්ෂිත තැනැත්තන්ට හෝ දේපළවලට එරෙහිව සිදුකරන, ඒ සම්මුතියේ 130 වන වගන්තියේ සඳහන් ක්‍රියාවක් ඇතුළත්ව, ඒ සම්මුතිය උල්ලංඝනය කිරීමක්, තෙවන සම්මුතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් වන්නේ ය ;

(ඈ) සිව්වන සම්මුතිය මගින් ආරක්ෂිත තැනැත්තන්ට හෝ දේපලවලට එරෙහිව සිදු කරන, ඒ සම්මුතියේ 147 වන වගන්තියේ සඳහන් ක්‍රියාවක් ඇතුළත්ව, ඒ සම්මුතිය උල්ලංඝනය කිරීමක්, සිව්වන සම්මුතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා ''ආධාර කිරීම'', ''අනුබල දීම'' ''කුමන්ත්‍රණය කිරීම'' සහ ''කෙනෙකු ලවා සිදුකරවීම'' යන යෙදුම්වල, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ එම යෙදුම්වලට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(4) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු—

(අ) සිදු කර තිබෙන වරදට, ඉහත සඳහන් යම් සම්මුතියකින් ආරක්ෂිත තැනැත්තකුව, චේතනාන්විතව මරණයට පත්කිරීම ඇතුළත් වන අවස්ථාවක, ඒ තැනැත්තාට මරණීය දණ්ඩනයෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය ;

(ආ) වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.

නීතිපතිවරයා අධිචෝදනා පත්‍ර ගොනු කළ යුතු බව.

3. දෙවන වගන්තියට අනුව වන වරදක් සම්බන්ධයෙන් වන සෑම නඩු පැවරීමක්ම, 6 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, නීතිපතිවරයා විසින් ගොනු කරනු ලබන සෘජු අධිචෝදනා පත්‍ර මගින් විය යුතු ය.

වැරදි සම්බන්ධ නඩු විභාග කිරීම සඳහා මහාධිකරණයට අධිකරණ බලය ඇති බව.

4. (1) මේ පනත යටතේ වූ සෑම වරදක් සම්බන්ධයෙන්ම නඩු විභාග කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද, කොළඹ පැවැත්වෙන, බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ වූ සෑම වරදක්ම 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ ඒ පනතේ කාර්ය සඳහා, සංඥේය වරදක් සහ ඇපදිය නොහැකි වරදක් වන්නේ ය.

(3) තෙවන සම්මුතියේ 5 වන වගන්තියේ සඳහන් තැනැත්තකු විසින් තමාට ආරක්ෂිත යුධ සිරකරුවකුගේ තත්ත්වය හිමි බවට ප්‍රකාශයක් ලබාගැනීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) අවස්ථාවෝචිත පරිදි මහජනයා හෝ අධිකරණය නිශ්චිතව සඳහන් කරන යම් තැනැත්තකු හෝ පැමිණ සිටීම යුක්ති ධර්මයට පටහැනි බවට හෝ මහජන යහපත පිණිස නොවන බවට මහාධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, එම අධිකරණයේ යම් නඩු විභාගයක් පැවැත්වෙමින් තිබිය දී මහජනයා හෝ අධිකරණය විසින් නිශ්චිතව නියම කරනු ලබන යම් තැනැත්තකු හෝ අධිකරණයෙන් බැහැර කරන ලෙස මහාධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

සම්මුති අදාළ බව ඔප්පු කිරීම.

5. සම්මුති අතරින් යම් සම්මුතියක් බරපතල ලෙස උල්ලංඝනය කිරීම සම්බන්ධ යම් නඩු කටයුත්තක දී එකී උල්ලංඝනය සම්බන්ධයෙන් එකී සම්මුතිය අදාළ වන්නේ කවර අවස්ථාගත තත්ත්වයකදී ද යන්න පිළිබඳව, මේ පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රශ්නයක් මතු වූ අවස්ථාවක, යම් විශේෂිත තත්ත්වයක් පවතින විටකදී සම්මුතියක් අදාළ වන බවට විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සනින් වූ සහතිකයක් මෙම කාරණය පිළිබඳ සාක්ෂියක් ලෙස ආවේශ්‍ය කරගත හැකි අතර එය එම කාරණය පිළිබඳ මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

මේ පනතට අදාළව යුද්ධාධිකරණ නීති කෘත්‍යවල තත්ත්වය.

6. (357 වන අධිකාරය වූ) යුධ හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යන යම් පනතක් යටතේ ශ්‍රී ලංකාවෙහි කැඳවනු ලැබූ යුද්ධාධිකරණයක අධිකරණ බලය සම්බන්ධයෙන් එකී පනතේ විධිවිධාන, මේ පනතේ විධිවිධාන පනවනු නොලැබුවාක් සේ පිළිවෙළින් ඉහත කී පනත්වල විධිවිධාන සලස්වා ඇති ආකාරයට තවදුරටත් අදාළ වන්නේ ය.

II වන කොටස

ආරක්ෂිත තැනැත්තන් පිළිබඳ නීති කෘත්‍ය

ආරක්ෂිත තැනැත්තන් පිළිබඳ නඩු විභාගවලට අදාළව ආරක්ෂක බලධරයන්ට නොතිසි යැවීම යනාදිය.

7. (1) (අ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් නඩු විභාගයක් සඳහා, ආරක්ෂිත යුධ සිරකරුවකු අධිකරණය වෙත ගෙන එනු ලැබූ විට ඒ අධිකරණය විසින් ; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් සම්බන්ධ නඩු විභාගයක් සඳහා ආරක්ෂිත සිමාවාසික සිරකරුවකු, ඒ වරද සම්බන්ධයෙන් අවුරුදු දෙකක් හෝ ඊට වැඩි කාලයකට දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීමට බලය ඇති අධිකරණයක් වෙත නඩු විභාගයක් සඳහා ගෙන එනු ලැබූ විට ඒ අධිකරණය විසින්,

චෝදක දන්නා තාක් දුරට (2) වන උපවගන්තියේ ගෙනහැර දැක්වෙන කාරණ සඳහන් දැන්වීමක්, චෝදක බලාධිකාරයක් ඇත්නම් එම බලාධිකාරය වෙත සහ චූදිතයා ආරක්ෂිත යුධ සිරකරුවකු නම් එම චූදිතයා වෙත හා සිරකරුගේ නියෝජිතයා වෙත, සති තුනකට පූර්වයෙන් භාරදී තිබෙන බව අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන තෙක්, එම නඩු විභාගය පිළිබඳ ඉදිරි කටයුතු කරගෙන නොයා යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමෙහි පහත දැක්වෙන කරුණු ඇතුළත් කළ යුතු ය :—

(අ) චූදිතයාගේ වෘත්තීය හෝ රක්ෂාව ඇතුළුව ඔහුගේ සම්පූර්ණ නම, උපන් දිනය සහ විස්තරය ;

(ආ) චූදිතයා ආරක්ෂිත යුධ සිරකරුවකු වන අවස්ථාවක ඔහුගේ නිලය, ඔහු අයත් හමුදාව, ඔහුගේ රෙජිමේන්තු, පෞද්ගලික සහ අනුක්‍රමික අංකය ;

(ඇ) චූදිතයා රඳවා සිටින, සීමාවාසිකව සිටින හෝ පදිංචිව සිටින ස්ථානය ;

(ඈ) චූදිතයාට චෝදිත වරද ; සහ

(ඉ) නඩු විභාගය පැවැත්වීමට නියමිත අධිකරණය සහ නඩු විභාගයට නියමිත දිනය සහ වේලාව.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) අවස්ථාවෝචිත පරිදි, ආරක්ෂක බලාධිකාරය වෙනුවෙන් හෝ සිරකරුගේ නියෝජිතයා විසින් හෝ චූදිත තැනැත්තා විසින් අත්සන් කර තිබෙන බවට උද්දේශිත ලේඛනයක්; සහ

(ආ) මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව භාරදෙන ලද දැන්වීමක් බවට ලේඛනයේ විස්තර කර තිබෙන දැන්වීමක්, නිශ්චිත දිනයක දී එම බලාධිකාරය වෙත, නියෝජිතයා වෙත හෝ තැනැත්තා වෙත ලැබුණු බව දැනුම් දෙන ලේඛනයක් බවට උද්දේශිත ලේඛනයක්,

එය එසේ නොවන බව පෙන්නුම් කරනු ලැබුවහොත් මිස (1) වන උපවගන්තියෙන් නියමිත දැන්වීම එකී බලාධිකාරය වෙත, නියෝජිතයා වෙත හෝ තැනැත්තා වෙත එම දිනයේ දී භාරදුන් බවට ප්‍රමාණවත් සාක්ෂියක් වන්නේ ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා කිසියම් නිශ්චිත වේලාවක දී කිසියම් නිශ්චිත යුධ සිරකරුවකු සම්බන්ධයෙන් වන විට "සිරකරුගේ නියෝජිතයා" යන යෙදුමෙන්, ඒ යුධ සිරකරුව ආරක්ෂිත යුධ සිරකරුවකු ලෙස රඳවාගෙන සිටි හෝ එකී වේලාවට පෙර අවසන් වරට රඳවාගෙන සිටි කඳවුරේදී හෝ ස්ථානයේ දී තුන්වන සම්මුතියේ 79 වන වගන්තියේ අර්ථානුකූලව සිරකරුගේ නියෝජිතයා ලෙස කටයුතු ක්‍රියාවේ යොදනු ලැබිය හැකිව තිබුණු තැනැත්තා අදහස් වේ.

(5) මේ වගන්තියේ නියමිත කාර්ය ඉටුකිරීමට හැකිවනු පිණිස නඩු විභාගයක් අඩාලව කල් තබන අධිකරණයක් විසින්, වෙනත් යම් ලිඛිත නීතියක කවර විධිවිධානයක් තිබුණ ද, එම නඩු විභාගය එසේ අඩාලව කල් තබනු ලබන කාලසීමාව සඳහා චූදිතයා රිමාන්ඩ් බන්ධනාගාරගත කරනු ලැබිය හැකි ය.

යුධ සිරකරුවන් සඳහා නීත්‍යනුකූල නියෝජනය.

8 (1) (අ) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධ නඩු විභාගය සඳහා යම් තැනැත්තකු යම් මහාධිකරණයක් වෙත ගෙන එන ලද්දේ ද ; නැතහොත්

(ආ) යම් වරදක් සම්බන්ධ නඩු විභාගය සඳහා ආරක්ෂිත යුධ සිරකරුවකු යම් මහාධිකරණයක් වෙත ගෙන එන ලද්දේ ද,

ඒ මහාධිකරණය විසින්—

(i) චූදිතයා වෙනුවෙන් නීතිඥවරයකු පෙනී සිටින්නේ නම් ;

(ii) නඩු විභාගයේ දී චූදිතයා වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥවරයාට ප්‍රථමයෙන් උපදෙස් දෙනු ලැබ දවස් විසිඑකක කාල සීමාවක් ඉකුත්ව ඇති බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පුකර ඇත්නම්,

මිස නඩු විභාගය පවත්වාගෙන නොයා යුතු අතර මේ උපවගන්තියේ නියමයක් අනුව ක්‍රියාකිරීමට ඉඩ ලබාදීමේ කාර්යය සඳහා අධිකරණය විසින් නඩුව අඩාලව කල්තබනු ලැබුවහොත් එවිට, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද නඩුව එසේ අඩාලව කල් තබනු ලැබූ කාලසීමාව සඳහා සුදුසු යයි අධිකරණය අදහස් කරන යම් ආරක්ෂා භාරයක් යටතේ චූදිතයා රඳවා තබාගැනීම පිණිස අධිකරණය විසින් බලය දෙනු ලැබිය හැකි ය.

(2) චූදිතයා ආරක්ෂිත යුධ සිරකරුවකු වන අවස්ථාවක ඔහු වෙනුවෙන් පෙනී සිටින බව ඔහු පිළිගත් නීතිඥවරයකු නොමැති නම්, ආරක්ෂක බලාධිකාරය වෙනුවෙන් පෙනී සිටීමේ කාර්යය සඳහා උපදෙස් ලත් නීතිඥවරයා, (1) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ නියමයන්ට අගතියක් නොමැතිව, ඒ වගන්තියේ කාර්ය සඳහා චූදිතයා වෙනුවෙන පෙනී සිටින නීතිඥවරයා ලෙස සැලකිය යුතු ය.

(3) චූදිතයා වෙනුවෙන් නීතිඥවරයකු පෙනී නොසිටීමේ හේතුව මත (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර අධිකරණය විසින් නඩු විභාගයක් අඩාලව කල් තබනු ලැබුවහොත්, ඒ වරද සම්බන්ධ ඉදිරි නඩු කටයුතුවල දී චූදිතයාගේ ස්වාර්ථ සම්බන්ධතා පිළිබඳව විමසිලිමත්ව

ක්‍රියා කිරීම සඳහා නීතිඥවරයකුට පවරන ලෙස අධිකරණය විසින් විධාන කල යුතු ය. ඉන් අනාගත නඩු කටයුතුවලදී, චූදිතයා විසින් ඔහු වෙනුවෙන් පෙනී සිටින බවට පිළිගන්නා ලද නීතිඥවරයකු හෝ (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් පරිදි උපදෙස් ලැබූ නීතිඥවරයකු හෝ නොමැති වුවහොත්, මේ උපවගන්තිය යටතේ පවරනු ලැබූ නීතිඥවරයා, (1) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒ උපවගන්තියේ කාර්ය සඳහා චූදිතයා වෙනුවෙන් පෙනී සිටින ලෙස සැලකිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර නීතිඥවරයකුට පවරන ආකාරය සහ ඒ නීතිඥවරයකුට ගෙවිය යුතු ගාස්තුව නියම කරනු ලබන පරිදි විය යුතු ය.

9. (1) ආරක්ෂිත යුධ සිරකරුවකු හෝ ආරක්ෂිත සීමා වාසිකයකු අවුරුදු දෙකක් ඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබූ අවස්ථාවක, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අභියාචන දැන්වීම දිය යුතු කාලසීමාව, ආරක්ෂිත තැනැත්තන්ගේ අභියාචන.

(අ) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක යුධ සිරකරුවකු සම්බන්ධයෙන් වන විට, ඔහුගේ රටෙහි සන්නද්ධ හමුදාවක නිලධරයකු විසින් ද ;

(ආ) සීමාවාසික සිරකරුවකු සම්බන්ධයෙන් වන විට ඔහු සීමාවාසිකව සිටින බන්ධනාගාරයේ අධිකාරවරයා විසින් හෝ වෙනුවෙන් ද,

දෙනු ලබන, ආරක්ෂිත යුධ සිරකරු හෝ සීමාවාසික සිරකරු, වරදකරු කිරීම හෝ ඔහු පිළිබඳ දණ්ඩන නියමය ආරක්ෂක බලාධිකාරිය වෙත දැනුම් දුන් බවට වූ දැන්වීම ඔහු වෙත ලැබුණු දින පටන් හෝ එම වරදකරු කිරීම එකී දිනයේ දී සිදු වී නම් නැතහොත් දණ්ඩන නියමය එදින ප්‍රකාශයට පත්කරන ලදනම්, ඉඩදෙනු ලැබිය හැකිව තිබුණු යම් වැඩිදුර කාලයකදී ආරම්භ වන ලෙස සැලකිය යුතු ය.

(2) අධිකරණය විසින් ආරක්ෂිත යුධ සිරකරුවකු හෝ ආරක්ෂිත සීමාවාසික සිරකරුවකු වරදකරු කරනු ලැබීමට හෝ ඒ සිරකරුවකුට දණ්ඩන නියමයක් කරනු ලැබීමට එරෙහිව කල අභියාචනයක් විභාග කිරීමෙන් පසු ඒ දණ්ඩන නියමය නොවෙනස්ව පවතින හෝ එය අවුරුදු දෙකක් ඉක්ම වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් බවට පත් වූ අවස්ථාවක, එම මුල් අභියාචනය මත තහවුරු කරන ලද හෝ වෙනස් කරන ලද වරදකරු කිරීමට හෝ දණ්ඩන නියමයට

විරුද්ධව වැඩිදුර අභියාචනයකට අදාළව අවසර දෙන යම් කාලයක්, වරදකරු කරනු ලැබූ තැනැත්තාට, අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තා විසින් දෙන ලද එම මුල් අභියාචනයේ අධිකරණ තීරණය ආරක්ෂක බලාධිකාරය වෙත දැනුම් දෙන ලද බවට දැන්වීමක් ලැබෙන දිනය දක්වා ව්‍යාප්ත වන ලෙස සැලකිය යුතු අතර, ඒ තීරණය එම දිනයේ දී ප්‍රකාශයට පත් කරන ලද්දේ නම් ඉඩ දෙනු ලැබිය හැකිව තිබුණු යම් වැඩිදුර කාලයක් දක්වා ද ව්‍යාප්ත විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන, වරදකරු කරනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් අදාල කර ගැනීමේ දී අධිකරණය අන්‍යාකාර ආඥාවක් කළහොත් මිස, අතෘප්ත තැනැත්තකුට දේපල ආපසු ලබාදීම හෝ වන්දි ගෙවීම පිළිබඳව අධිකරණයේ ආඥාව බලාත්මක නොවිය යුතු අතර වරදකරු කරනු ලැබීමේ දී දේපළ පුනවේෂ්ටනය පිළිබඳ යම් නීතියක විධිවිධානයක්, (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා තිබෙන පරිදි කාලය දීර්ඝ කිරීමක් නොවන, කාලය දීර්ඝ කිරීමකින් තොරව වරදකරු කරනු ලැබූ තැනැත්තාට ඔහුගේ වරදට හෝ දණ්ඩන නියමයට එරෙහිව අභියාචනයක් කිරීමට හැකි අවස්ථාවක, එම වරදකරු කිරීම හා සම්බන්ධව බලාත්මක නොවිය යුතු ය.

(4) වරදකරු කිරීමකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව, නැතහොත් කලින් අභියාචනයක් මත අධිකරණ තීරණයකට විරුද්ධව අභියාචනයකට අවස්ථාවෝචිතව, ඒ වරදකරු කිරීම හෝ දණ්ඩන නියමය කරන අවස්ථාව වන විට, ආරක්ෂක බලාධිකාරයක් නොවූයේ නම්, (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

දණ්ඩන නියමය සහ ආරක්ෂිත යුද සිරකරුවන් හා ආරක්ෂිත සීමාවාසික සිරකරුවන් අත්අඩංගුවේ තබා සිටින කාලය අඩු කිරීම.

10. (1) ආරක්ෂිත යුධ සිරකරුවකු හෝ ආරක්ෂිත සීමාවාසික සිරකරුවකු වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක අධිකරණය විසින්—

(අ) මරණීය දණ්ඩනය සඳහා වූ දණ්ඩන නියමයක් සම්බන්ධයෙන් වන විට, එම නඩුවට අදාළ සියලු සිද්ධි කරුණු සලකා, එම දණ්ඩන නියමය ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමක් බවට කළ හැකි ද යන්න සලකා බැලිය යුතු ය ;

(ආ) එම වරද සම්බන්ධයෙන් බන්ධනාගාරගත කිරීමේ කාලසීමාවක් නියම කිරීමේ දී අන්‍යාකාරව නියම කරනු ලැබිය හැකිව තිබුණු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාවෙන්, එම වරදකරු කරනු ලැබූ තැනැත්තා ඒ වරද සම්බන්ධයෙන් නඩු විභාගයට පෙර අත්අඩංගුවේ සිටි යම් කාලසීමාවක් අඩු කරනු ලැබිය යුතු ය ;

(ඇ) බන්ධනාගාරගත කිරීම නොවන වෙනත් දණ්ඩනයක් ඒ වරද සම්බන්ධව නියම කිරීමේ දී එකී අත්අඩංගුවේ සිටි කාලය සැලකිල්ලට ගත යුතු ය.

(2) වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින ආරක්ෂිත යුධ සිරකරුවකු, නඩු විභාගය තෙක් මාස තුනකට නොඅඩු සමස්ත කාලසීමාවක්, ඒ වරද සම්බන්ධයෙන් යුධ කඳවුරක් හෝ ආරක්ෂිත යුධ සිරකරුවන් රඳවා තබා ගන්නා ස්ථානයක් නොවන තැනක අත්අඩංගුවේ සිට ඇති බවට නීතිපතිවරයා සෑහීමට පත්වන අවස්ථාවක එම සිරකරුවා එම අත්අඩංගුවෙන් සන්නද්ධ හමුදා අත්අඩංගුවට මාරුකරන ලෙස, සහ එතැන් සිට යුධ කඳවුරක හෝ ආරක්ෂිත යුධ සිරකරුවන් රඳවා තබාගන්නා වෙනත් ස්ථානයක රඳවා තබාගෙන, නඩු විභාගය සඳහා නියමිත දිනයේදී සහ වේලාවට අධිකරණය හමුවට ගෙන එන ලෙස නීතිපතිවරයාගේ ඉල්ලීම මත මහාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ය.

III වන කොටස

රතු කුරුසය සහ වෙනත් ලාංඡන අනිසි ලෙස යෙදීම

11. (1) අමාත්‍යවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ලියවිල්ලක් මගින් බලය දෙනු ලැබ ඇත්නම් මිස, කවර වූ හෝ කාර්යයක් සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි යම් නැවක හෝ ගුවන් යානයක— ලාංඡන යොදා ගැනීම තහනම් කිරීම.

(අ) සුදු පසුබිමකින් සම්පූර්ණයෙන් වටවුණු එකම දිගින් යුතු තිරස් හා සිරස් අත්කඩවලින් සෑදුණු රතු කුරුස ලාංඡනය හෝ ''රතු කුරුස'' යන සලකුණ ;

(ආ) සුදු පසුබිමකින් සම්පූර්ණයෙන් වටවුණු හා එම පසුබිම මත ''රතු චන්ද්‍රවංක'' ලාංඡනය හෝ රතු චන්ද්‍රවංක සළකුණ ;

(ඇ) සම්පූර්ණ සුදු පසුබිමක් මත ඉදිරි දකුණු පාදයෙන් වක්‍රාකාර කඩුවක් සෘජුව දරාගෙන නරඹන්නන් දෙසට මුහුණු හරවාගෙන, දකුණු පස සිට වම් පසට යන රත් පැහැ සිංහ රුවක් සහ හිරුගේ උඩ අර්ධයෙන් නික්මෙන රැස් සිංහ රුවේ පිටට ඉහලින් නිකුත්වන සේ දැක්වෙන ''රතු සිංහ ලාංඡනය'' හෝ ''රක්ත සිංහ හා සූර්ය'' සළකුණ ;

(ඈ) ස්විස් කොන්ෆෙඩරේෂනයේ වංශාධිපති ලාංඡනය වන රතු පසුබිමකින් සම්පූර්ණයෙන් වටවුණු එකම දිගින් යුත් තිරස් හා සිරස් අත්කඩවලින් සැදුණු සුදු හෝ රිදී පැහැ කුරුස ලාංඡනය ; සහ

(ඉ) මෙහි මීට ඉහතින් (අ) සිට (ඈ) දක්වා ඡේදවල නිශ්චිතව දැක්වෙන යම් ලාංඡනයක් හෝ සළකුණක් ලෙස වරදවා ගැනීමේ හෝ ඒ යම් ලාංඡනයක් හෝ සළකුණක් ලෙස තේරුම් ගනු ලැබිය හැකිතාක් දුරට ඒ යම් ලාංඡනයකට හෝ සළකුණකට ආසන්න වශයෙන් සමාන සැලැස්මක් හෝ ජාථයක්,

යොදා ගැනීම හෝ ප්‍රදර්ශනය කිරීම, නැතහොත් යොදා ගැනීමට හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමෙන් පසුව යම් අවස්ථාවක, ජිනිවා සම්මුතිවල රාජ්‍ය පාර්ශ්ව විසින් යම් අමතර හඳුනා ගැනීමේ ලාංඡනයක් යොදාගනු ලැබුවහොත්, එසේ යොදාගනු ලබන යම් ලාංඡනයක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්ය සඳහා සහ යොදාගැනීම හෝ ප්‍රදර්ශනය කිරීම පිණිස මේ වගන්තියේ නියමයන් ප්‍රකාර අමාත්‍යවරයා විසින් බලය පැවරීම අවශ්‍ය ලාංඡනයක් බවට ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබුවහොත් එවිට,—

(අ) පළමු වරද සම්බන්ධයෙන් වන විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ;

(ආ) දෙවන වරද සම්බන්ධයෙන් වන විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට ;

(ඇ) තුන්වන වරද සම්බන්ධයෙන් වන විට, රුපියල් තිස් පන් දහසක් නොඉක්මවන දඩයකට ; සහ

(ඈ) තදනන්තරව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් පනස් දහසක දඩයකට සහ මාස තුනක් නොඉක්මවන කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට,

යටත් වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් ලාංඡනය සහ සලකුණ භාවිතා කිරීම පිළිබඳව උපදෙස් සහ මාර්ගෝපදේශ නිශ්චය කොට දැක්වීම පිණිස සහ I වන උපලේඛනයේ, II වන උපලේඛනයේ, III වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ දැක්වෙන කවර හෝ සම්මුතියක කාර්ය සඳහා ලාංඡනය හා සළකුණ යොදා ගැනීම විධිමත් කිරීම පිණිස හෝ යම් ලාංඡනයක් හෝ සළකුණක් විධිමත් කිරීම පිණිස යෝග්‍ය විධිවිධාන සැලැස්වීම සඳහා සහ මේ වගන්තියට අනුකූලව දෙනු ලබන යම් බලය පැවරීමක් යටත්වන කොන්දේසි සහ සීමා කිරීම් නියම කරන නියෝග සාදනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ අන්තර්ගත තහනම් කිරීම් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනට පෙරාතුව අදාළ වූ නීතිය යටතේ ලියාපදිංචි කළ වෙළෙඳ ලකුණකට අදාළ නොවිය යුතු අතර (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කළ බවට යම් තැනැත්තකු චූදිතයකු වන අවස්ථාවක—

(අ) මේ පනත ක්‍රියාත්මකවීමට පූර්ව දිනයක සිට ඔහු එම ලාංඡනය හෝ සළකුණ නීත්‍යානුකූලව භාවිත කරමින් සිටි බව ;

(ආ) එම ලාංඡනය, චිග්නය, නාමය හෝ සංඥාව භාවිත කරනු ලබන්නේ යම් භාණ්ඩ සඳහා ද එම ලාංඡනය, චිග්නය, නාමය හෝ සංඥාව එම භාණ්ඩ එම තැනැත්තා විසින් ලබාගැනීමට පෙරාතුව ව්‍යාපාරික ක්‍රියාමාර්ගවල දී එම භාණ්ඩ නිෂ්පාදනය කළ හෝ ඒවා සම්බන්ධ ගනුදෙනු කළ වෙනත් යම් තැනැත්තකු විසින් එම භාණ්ඩවලට යොදාගෙන තිබුණු බව සහ මේ පනත ක්‍රියාත්මකවීමට පෙරාතුව නීත්‍යානුකූලව ඒවා ප්‍රයෝජනයට ගත් බව,

ඔප්පු කිරීම ඒ චූදිත තැනැත්තා සඳහා විත්තිවාචකයක් වන්නේ ය.

(6) මේ වගන්තියට එරෙහිව පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක, එම වරද සංයුක්ත වන ක්‍රියාව හෝ ආකෘතිය තමාගේ අනුදැක්මක් නොමැතිව සිදු කළ බව සහ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස අවශ්‍ය සියලු පියවර තමා විසින් ගන්නා ලද බව ඔප්පු කිරීමට සමත් වුවහොත් මිස, එම පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමණාකරුවෙක්, ලේකම්වරයෙක් හෝ වෙනත් සෑම නිලධරයෙක්ම ඒ වරදට වරදකරු වන්නේ ය.

IV වන කොටස

පොදු විධිවිධාන

නියෝග.

12. (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලැබූ දිනයේ පටන් ක්‍රියාත්මක වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ පසුව පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා හැකිතාක් ඉක්මණින් එය පාර්ලිමේන්තුව හමුවට පමුණුවනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය.

14. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස මේ පනතෙහි—

"සම්මුතිය" යන්නෙන් මේ පනතේ I වන උපලේඛනයේ II වන උපලේඛනයේ, III වන උපලේඛනයේ සහ IV වන උපලේඛනයේ දැක්වෙන පළමුවන සම්මුතිය, දෙවන සම්මුතිය, තුන්වන සම්මුතිය සහ සිව්වන වන සම්මුතියේ අදාල වගන්ති අදහස් වේ ;

"අධිකරණය" යන්නට පිළිවෙලින් (357 වන අධිකාරය වූ) යුධ හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත, (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යන පනත්වල අර්ථානුකූලව පිහිටුවන යුද්ධාධිකරණයක් ඇතුළත් වේ ;

"ආරක්ෂිත සීමාවාසික සිරකරු" යන්නෙන් හතරවන සම්මුතිය මගින් ආරක්ෂිත හා ශ්‍රී ලංකාවේ සීමාවාසයට පත් කළ තැනැත්තෙක් අදහස් වේ ;

"ආරක්ෂිත බලාධිකාරය" යන්න ආරක්ෂිත සිමාවාසික සිරකරුවකු සම්බන්ධයෙන් හෝ ආරක්ෂිත යුද සිරකරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, එම යෙදුමෙන් තමන් අයත් රාජ්‍යයේ ජාතිකත්වය දරන හෝ එම රාජ්‍යයේ සන්නද්ධ හමුදාවල සාමාජිකත්වය දරන හෝ යම් වැදගත් අවස්ථාවක එහි සාමාජිකත්වය දැරූ සහ තුන්වන සම්මුතිය යටතේ හෝ අවශ්‍ය විය හැකි පරිදි සිව්වන සම්මුතිය යටතේ තමන් වෙත පැවරෙන කාර්ය එම රාජ්‍යයේ ස්වාර්ථ සම්බන්ධතා උදෙසා ඉටුකිරීමෙහි නියුක්තව සිටින බලාධිකාරය හෝ සංවිධානය අදහස් වේ ;

"ආරක්ෂක යුධ සිරකරු" යන්නෙන් තෙවන සම්මුතිය මගින් ආරක්ෂිත තැනැත්තෙක් අදහස් වේ.

I වන උපලේඛනය (2 වන, 11 වන සහ 13 වන වගන්ති)

යුධබිමේ සිටින සන්නද්ධ හමුදාවන්හි තුවාල ලත් හා රෝගාතුර සාමාජිකයන්ගේ තත්ත්වය යහපත් කිරීම පිළිබඳ 1949 අගෝස්තු 12 දිනැති ජිනිවා සම්මුතිය

අදාළ විධිවිධාන

IX වන පරිච්ඡේදය

දූෂණ සහ උල්ලංඝන මැඩපැවැත්වීම

49 වන වගන්තිය

මෙම සම්මුතියේ පහත දැක්වෙන වගන්තියේ අර්ථ කථනය කර තිබෙන බරපතළ උල්ලංඝන කිසිවක් සිදු කරන හෝ සිදු කිරීමට අණ කරන තැනැත්තන් කෙරෙහි සාර්ථක දණ්ඩන පැනවීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්මත කිරීමට ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව ගිවිස ගනී.

එවැනි බරපතළ උල්ලංඝන සිදු කළ හෝ සිදු කිරීමට අණ කළ තැනැත්තන් සොයා ගැනීමේ සෝදිසි මෙහෙයුම් පැවැත්වීමට එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය බැඳී සිටින අතර, එම තැනැත්තන්ගේ ජාතිකත්වය කුමක් වුවද, ඒ තැනැත්තන් තම රජයේ අධිකරණ හමුවට පැමිණවීම එක් එක් රාජ්‍ය පාර්ශ්වය විසින් කරනු ලැබිය යුතු ය. ඒ ඒ ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයේ මනාපය අනුව සහ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයක් විසින් මුල් බැල්මට පෙනෙන කාරණ ඉදිරිපත් කරන්නේ නම්, එම තැනැත්තන්, නඩු විභාගය සඳහා එකී වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට, එම රටෙහි ව්‍යවස්ථාවලට අනුකූලව භාර දෙනු ලැබිය හැකි ය.

මෙහි පහත වගන්තියේ අර්ථකථනය කර තිබෙන බරපතළ උල්ලංඝන හැර, මේ සම්මුතියේ විධිවිධානවලට පටහැනි සියලු ක්‍රියා මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පියවර එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය විසින් ගනු ලැබිය යුතු ය.

සියලු අවස්ථාගත තත්ත්වයන්හි දී නිසි නඩු විභාගයක් ලැබීමේ සහ විත්තිවාචකයන් දිය හැකි වීමේ ආරක්ෂක ක්‍රියාමාර්ග මගින් චූදිත තැනැත්තන්ට ප්‍රතිලාභ අත්වන අතර, එම ක්‍රියාමාර්ග, 105 වන වගන්තියෙන් සහ යුධ සිරකරුවන්ට සැලකීම පිළිබඳ 1949 අගෝස්තු 12 දිනැති ජිනීවා සම්මුතියේ පහත දැක්වෙන වගන්තිවලින් සලසා ඇති ප්‍රතිකර්මවලට වඩා අඩු වාසිදායක නොවිය යුතු ය.

50 වන වගන්තිය

මෙහි පහත සඳහන් කවර හෝ ක්‍රියාවක්, සම්මුතියෙන් ආරක්ෂිත තැනැත්තන් හෝ දේපළ විෂයයෙහි සිදුකරනු ලැබුවහොත්, එය මීට ඉහත වගන්තියට අදාළ බරපතළ උල්ලංඝන වන්නේ ය. චේතනාන්විත ඝාතනය, වධහිංසා කිරීම හෝ ජීවවිද්‍යාත්මක අත්හදා බැලීම්ද ඇතුළත්ව අමානුෂික සැලකිල්ල ශාරීරිකව හෝ සෞඛ්‍යයට තදබල වේදනා හෝ බරපතල තුවාල චේතනාන්විතව සිදු කිරීම සහ යුධමය අවශ්‍යතා වශයෙන් යුක්ති යුක්ත නොවන හා නීති විරෝධීව සහ හිතුවක්කාරව විශාල වශයෙන් සිදු කරන දේපළ විනාශය සහ දේපළ අත්පත් කර ගැනීම

51 වන වගන්තිය

කිසිදු ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට ඒ පාර්ශ්වය විසින් හෝ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයක් විසින් හෝ මීට ඉහතින් වූ වගන්තියේ සඳහන් උල්ලංඝන සම්බන්ධයෙන් දරන්නා වූ වගකීමකින් තමන්ම හෝ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයන්ට හෝ විමුක්ත වීමට ඉඩ නොදිය යුතු ය.

52 වන වගන්තිය

සිදු කරන ලද බවට චෝදිත සම්මුතිය උල්ලංඝනය කිරීමක් සම්බන්ධව, ගැටුමෙහි පාර්ශ්වයක ඉල්ලීම මත, ඊට සම්බන්ධ පාර්ශ්ව අතර තීරණය කරගනු ලැබිය යුතු ආකාරයකට පරීක්ෂණයක් ආරම්භ කළ යුතු ය.

පරීක්ෂණයේ කාර්ය පටිපාටිය පිළිබඳව එකඟත්වයකට එළඹ නොමැතිනම් තීරකයකු තෝරාගැනීම පිළිබඳව පාර්ශ්වකරුවන් එකඟ විය යුතු අතර, අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය එම තීරක විසින් තීරණය කරනු ලැබේ.

උල්ලංඝනය තහවුරු කරගනු ලැබූ පසු, ගැටුමේ පාර්ශ්ව විසින් එම උල්ලංඝනය අවසන් කළ හැකි අවම ප්‍රමාදයෙන් යුතු ව එය මැඩ පැවැත්විය යුතු ය.

53 වන වගන්තිය

මේ සම්මුතිය යටතේ රතු කුරුස හෝ ජිනීවා කුරුස ලාංඡනය හෝ අභිධානය පාවිච්චි කිරීමට හිමිකම තිබෙන පුද්ගලයන්, සමිති, ව්‍යාපාර ආයතන හෝ පෞද්ගලික පුද්ගලයන්, සමිති, ව්‍යාපාර ආයතන හෝ පොදු හෝ පෞද්ගලික සමාගම් විසින් "රතුකුරුස" හෝ "ජිනීවා කුරුස" ලාංඡනය හෝ ලකුණ නැතහොත් ඒ කිසිවක අනුකරණයක් සංයුක්ත වන යම් ලාංඡනයක් හෝ ලකුණක් පාවිච්චි කිරීම, එය පාවිච්චි කිරීමේ අරමුණ කුමක් වුවත් සහ එය යෙදීම ආරම්භ කළ දිනය කුමක් වුවත්, සැම කල්හිම තහනම් වන්නේ ය.

ප්‍රතිවර්තිතව පෙඩරල් වර්ණ යොදාගැනීමෙන් ස්විට්සර්ලන්තයට දක්වන ලද ගෞරවය සහ ස්විට්සර්ලන්ත ලාංඡනයේ අංග සහ සම්මුතියේ අනන්‍යතාවය හැඳින්වෙන ලාංඡනය අතර මතුවිය හැකි ව්‍යාකූලතා නිසා, පෞද්ගලික පුද්ගලයන්, සමිති හෝ ව්‍යාපාර ආයතන විසින් එම ස්විස් කන්ෆෙඩරේෂනයේ රාජ්‍ය ලාංඡනයේ අංග හෝ ඒවායේ අනුකරණයක් සංයුක්ත වන ලකුණු හෝ වෙළෙඳ ලකුණු හෝ වාණිජ ලකුණු ලෙස හෝ ඒ ලකුණුවල කොටසක් ලෙස යොදාගැනීම හෝ වාණිජ අවංකභාවයට පටහැනිව හෝ ස්විස් ජාතික මනෝභාවයට හිංසාවක් වියහැකි තත්ත්වයක් යටතේ යොදාගැනීම සෑම කල්හිම තහනම් වන්නේ ය :

එසේ වුවද, 1929 ජුලි 27 වන දිනැති සම්මුතියේ පාර්ශ්වකරුවන් නොවූ ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව විසින්, මෙහි පළමුවන ඡේදයේ නම්කර තිබෙන ලාංඡන අභිධාන, සංකේත හෝ ලකුණු ඊට පූර්වයෙන් භාවිතා කළ පාර්ශ්වවලට එම භාවිතය නතර කිරීම සඳහා, මෙම සම්මුතිය බලාත්මක වන දින සිට අවුරුදු තුනක් නොඉක්මවන කාලසීමාවක්, ඒවා එසේ භාවිතා කිරීමෙන්, යුද්ධයක් පවත්නා විටකදී මෙම සම්මුතියේ ආරක්ෂාව ඒ අනුව හිමිවන බවත් පෙන්නුම් නොකරන්නේ නම්, දෙනු ලැබිය හැකි ය.

මේ සම්මුතියේ පළමුවන ඡේදය මගින් කර තිබෙන තහනම, 38 වන වගන්තියේ දෙවන ඡේදයේ සඳහන් ලාංඡන සහ ලකුණු පූර්වයේ සිට භාවිතා කිරීමෙන් අත්කර ගන්නා ලද අයිතිවාසිකම්වලට බලපෑමක් රහිතව, අදාළ විය යුතු ය.

54 වන වගන්තිය

ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වවල දැනටමත් ඇති නීති ප්‍රඥප්ති 53 වන වගන්තිය යටතේ සඳහන් දූෂණ වැළැක්වීම සහ මැඩපැවැත්වීම සඳහා ප්‍රමාණවත් නොවන්නේනම් එම පාර්ශ්ව විසින් ඒවා වැළැක්වීම සහ මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

II වන උපලේඛනය (2 වන, 11 වන සහ 13 වන වගන්ති)

ගොඩබිමින් ඇත්ව මුහුදේ සිටින, සන්නද්ධ හමුදාවන්හි තුවාල ලත්, රෝගාතුර හා නැව මුහුදුබත්ව සිටින සාමාජිකයන්ගේ තත්ත්වය යහපත් කිරීම පිළිබඳ 1949 අගෝස්තු 12 දිනැති ජිනිවා සම්මුතිය.

අදාළ විධිවිධාන

VIII වන පරිච්ඡේදය

දූෂණ සහ උල්ලංඝනය මැඩපැවැත්වීම

50 වන වගන්තිය

මෙම සම්මුතියේ පහත දැක්වෙන වගන්තියේ අර්ථ කථනය කර තිබෙන බරපතල උල්ලංඝන කිසිවක් සිදු කරන හෝ සිදු කිරීමට අණ කරන තැනැත්තන් කෙරෙහි සාර්ථක දණ්ඩන පැනවීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්මත කිරීමට ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව ගිවිසගනී.

එවැනි බරපතල උල්ලංඝන සිදු කළ හෝ සිදු කිරීමට අණ කළ තැනැත්තන් සොයා ගැනීමේ සෝදිසි මෙහෙයුම් පැවැත්වීමට එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව බැඳී සිටින අතර, එම තැනැත්තන්ගේ ජාතිකත්වය කුමක් වුවද, ඒ තැනැත්තන් තම රජයේ අධිකරණ හමුවට පැමිණවීම එක් එක් ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව විසින් කරනු ලැබිය යුතු ය. ඒ ඒ ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයේ මනාපය අනුව සහ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයක් විසින් මුල් බැල්මට පෙනෙන කාරණා ඉදිරිපත් කරන්නේ නම්, එම තැනැත්තන්, නඩු විභාගය සඳහා එකී වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට, තම රටෙහි ව්‍යවස්ථාවලට අනුකූලව භාරගනු ලැබිය හැකි ය.

මෙහි පහත වගන්තියේ අර්ථකථනය කර තිබෙන බරපතල උල්ලංඝන හැර, මේ සම්මුතියේ විධිවිධානවලට පටහැනි සියලු ක්‍රියා මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පියවර එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව විසින් ගනු ලැබිය යුතු ය.

සියලු අවස්ථාගත තත්ත්වයන්හි දී නිසි නඩු විභාගයක් ලැබීමේ සහ විත්තිවාචකයක් දිය හැකි වීමේ ආරක්ෂක ක්‍රියාමාර්ග මගින් චූදිත තැනැත්තන්ට ප්‍රතිලාභ අත්වන අතර, එම ක්‍රියාමාර්ග, 105 වන වගන්තියෙන් සහ යුධ සිරකරුවන්ට සැලකීම පිළිබඳ 1949 අගෝස්තු 12 දිනැති ජිනීවා සම්මුතියේ පහත දැක්වෙන වගන්තිවලින් සලසා ඇති ප්‍රතිකර්මවලට වඩා අඩු වාසිදායක නොවිය යුතු ය.

51 වන වගන්තිය

මෙහි පහත සඳහන් කවර හෝ ක්‍රියාවක් සම්මුතියෙන් ආරක්ෂිත තැනැත්තන් හෝ දේපළ විෂයයෙහි සිදුකරනු ලැබුවහොත්, එය මීට ඉහත වගන්තියට අදාළ බරපතල උල්ලංඝන වන්නේ ය. චේතනාන්විත ඝාතනය, වධහිංසා කිරීම හෝ ජීව විද්‍යාත්මක අත්හදා බැලීම්ද ඇතුළත්ව අමානුෂික සැලකිල්ල ශාරීරිකව හෝ සෞඛ්‍යයට තදබල වේදනා හෝ බරපතල තුවාල චේතනාත්විතව සිදු කිරීම සහ යුධමය අවශ්‍යතා වශයෙන් යුක්ති යුක්ත නොවන හා නීති විරෝධීව සහ හිතුවක්කාරව විශාල වශයෙන් සිදු කරන දේපළ විනාශය සහ දේපළ අත්පත් කර ගැනීම.

III වන උපලේඛනය (2 වන, 11 වන සහ 13 වන වගන්ති)

යුධ සිරකරුවන්ට සැලකීම පිළිබඳ 1949 අගෝස්තු
12 දිනැති ජිනීවා සම්මුතිය

අදාළ විධිවිධාන
VI වන කොටස

සම්මුතිය ක්‍රියාවේ යෙදවීම
I වන වගන්තිය

පොදු විධිවිධාන
126 වන වගන්තිය

ආරක්ෂක බලාධිකාරවල නියෝජිතයන්ට හෝ දූතයන්ට, යුද සිරකරුවන් සිටින සියලු ස්ථානවලට, විශේෂයෙන් ඔවුන් රඳවා සිටින, සිරගත කර සිටින සහ වැඩෙහි යොදවා සිටින ස්ථානවලට යාමට සහ යුද සිරකරුවන් පරිහරණය කරන පරිශ්‍රවලට ප්‍රවිෂ්ට වීමට අවසර තිබිය යුතු ය ; තව ද අන් තැනකට මාරුකර යවන අවස්ථාවකදී

ඔවුන් පිටත්වන ගමන් කරන හා ගමනාන්ත ස්ථානවලට ද යාමට ඔවුන්ට අවසර තිබිය යුතු ය. ඔවුන්ට විශේෂයෙන් සිරකරුවන්ගේ නියෝජිතයන් සහ සිරකරුවන් සමග සාක්ෂිකරුවන් නොමැතිව පෞද්ගලිකව හෝ භාෂා පරිවර්තකයන් මගින් සම්මුඛව සාකච්ඡා කිරීමට අවකාශ තිබිය යුතු ය.

ආරක්ෂක බලාධිකාරවල නියෝජිතයන්ට සහ දූතයන්ට ඔවුන් බැලීමට යාමට රිසි ස්ථාන තෝරා ගැනීමේ නිදහස තිබිය යුතු ය. එසේ යන අවස්ථාවල දී ගත කරන කාලය හා ගමන් කරන වාර ගණන සීමා නොකළ යුතු ය. අනිවාර්ය යුධමය අවශ්‍යතාවක හේතුව මත හැර එම ගමන් තහනම් නොකළ යුතු අතර එසේ තහනම් කිරීම සුවිශේෂ හා තාවකාලික ක්‍රියා මාර්ගයක් පමණක් විය යුතු ය.

රඳවා තබා ගන්නා රාජ්‍යය සහ අදාළ යුධ සිරකරුවන් බලාපොරොත්තු තබා සිටින රාජ්‍යය විසින් අවශ්‍යනම් එම යුධ සිරකරුවන්ගේ ඒකදේශකයන්ට එම නියෝජිතයන් හෝ දූතයන් පැමිණෙන අවස්ථාවල දී සහභාගි වීමට අවසර දිය හැකි ය .

ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ දූතයන් ද එම පරමාධිකාරී බලයම භුක්ති විඳිය යුතු ය. එම දූතයන්ගේ පත් කිරීම, ඔවුන් යන්නේ යම් සිරකරුවන් බැලීම සඳහා ද එම සිරකරුවන් රඳවාගෙන සිටින බලාධිකාරයේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

127 වන වගන්තිය

මෙම සම්මුතියේ මූලධර්ම පිළිබඳව තම තමන්ගේ සියලු සන්නද්ධ හමුදා සහ මුළු මහත් ජනතාව ද දැනුවත් කිරීම පිණිස, යුද්ධය පවතින කාලය තුළ මෙන්ම සාමය පවතින කාලය තුළ දී ද මෙම සම්මුතියේ භාවය පිළිබඳ දැනීම තම තමන්ගේ රටවල හැකිතාක් පුළුල්ව ව්‍යාප්ත කිරීමට සහ විශේෂයෙන්ම යුධ උපදේශන වැඩසටහන්වල දී හා හැකිනම් සිවිල් උපදේශන වැඩසටහන්වල දී අධ්‍යයනය සඳහා ඇතුළත් කිරීමට, ගිවිසුම්ගත රාජ්‍ය පාර්ශ්ව ගිවිසගනී.

යුද්ධයක් පවත්නා කාලසීමාවල දී යුධ සිරකරුවන් පිළිබඳ වගකීම් භාරගන්නා යම් යුධ හමුදා හෝ වෙනත් බලධරයන් වෙත මෙම සම්මුතියේ වගන්ති තිබිය යුතු අතර සම්මුතියේ විධිවිධාන පිළිබඳව එම බලධරයන් විශේෂයෙන් උපදෙස් ලබා තිබිය යුතු ය.

128 වන වගන්තිය

ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව විසින් ඔවුනොවුන් අතර සංනිවේදනය ස්විස් ෆෙඩරල් කවුන්සිලය හරහා පවත්වාගත යුතු අතර, ගැටුම් පවතින අවස්ථාවල දී සම්මුතිය අදාළ කර ගන්නා බවට වගබලා ගැනීම පිණිස වර්තමාන සම්මුතියේ නිල පරිවර්තනය සහ තමන් විසින් උපයෝගී කරගත හැකි නීතිරීති හා නියෝග හරහා සන්නිවේදනය පවත්වා ගත යුතු ය.

129 වන වගන්තිය

මෙම සම්මුතියේ, පහත දැක්වෙන වගන්තියේ අර්ථකථනය කර තිබෙන බරපතල උල්ලංඝන කිසිවක් සිදු කරන හෝ සිදු කිරීමට අණ කරන තැනැත්තන් කෙරෙහි සාර්ථක දණ්ඩන පැනවීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්මත කිරීමට, ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව ගිවිස ගනී.

එවැනි බරපතල උල්ලංඝන සිදු කළ හෝ සිදු කිරීමට අණකළ තැනැත්තන් සොයා ගැනීමේ සෝදිසි මෙහෙයුම් පැවැත්වීමට එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය බැඳී සිටින අතර, එම තැනැත්තන්ගේ ජාතිකත්වය කුමක් වුවද, ඒ තැනැත්තන් තම රජයේ අධිකරණ හමුවට පැමිණවීම එක් එක් ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය විසින් කරනු ලැබිය යුතු ය. ඒ ඒ ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයේ මනාපය අනුව සහ ගිවිසුම්ගත ප්‍රධාන වෙනත් රාජ්‍ය පාර්ශ්වයක් විසින් මුල් බැල්මට පෙනෙන කාරණා ඉදිරිපත් කරන්නේ නම්, එම තැනැත්තන්, නඩු විභාගය සඳහා එකී වෙනත් ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට, තම රටෙහි ව්‍යවස්ථාවලට අනුකූලව භාරදෙනු ලැබිය හැකි ය.

මෙහි පහත වගන්තියේ අර්ථකථනය කර තිබෙන බරපතල උල්ලංඝන හැර, මේ සම්මුතියේ විධිවිධානවලට පටහැනි සියලු ක්‍රියා මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පියවර එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය විසින් ගනු ලැබිය යුතු ය.

සියලු අවස්ථාගත තත්ත්වයන් හි දී, නිසි නඩු විභාගයක් ලැබීමේ සහ නිසි විත්තිවාචකයක් දියහැකි වීමේ ආරක්ෂක ක්‍රියාමාර්ග මගින්, චූදිත තැනැත්තන්ට ප්‍රතිලාභ අත්වන අතර එම ක්‍රියාමාර්ග, 105 වන වගන්තියේ සහ වර්තමාන සම්මුතියෙන් සලසා ඇති ප්‍රතිකර්මවලට වඩා අඩු වාසිදායක නොවිය යුතු ය.

130 වන වගන්තිය

මෙහි පහත සඳහන් කවර හෝ ක්‍රියාවක්, සම්මුතියෙන් ආරක්ෂිත තැනැත්තන් හෝ දේපළ විෂයයෙහි සිදු කරනු ලැබුවහොත්, එය මීට ඉහත වගන්තියට අදාල බරපතල උල්ලංඝන වන්නේ ය. චේතනාන්විත ඝාතනය, වධහිංසා කිරීම හෝ ජීව විද්‍යාත්මක අත්හදා බැලීම් ද ඇතුළත්ව අමානුෂික සැලකිල්ල, ශාරීරිකව හෝ සෞඛ්‍යයට තදබල වේදනා හෝ බරපතල තුවාල චේතනාන්විතව සිදු කිරීම, පසමිතුරු රාජ්‍යයක යුද හමුදාවල සේවය කිරීමට බල කිරීම හෝ ආරක්ෂිත තැනැත්තකුට මෙම සම්මුතියෙන් හිමි සාධාරණ හා විධිමත් නඩු විභාගයක් ලැබීමේ අයිතිවාසිකම චේතනාන්විතව අහිමි කිරීම.

131 වන වගන්තිය

කිසිදු ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට ඒ පාර්ශ්වය විසින් හෝ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයක් විසින් හෝ මීට ඉහතින් වූ වගන්තියේ සඳහන් උල්ලංඝන සම්බන්ධයෙන් දරන්නා වූ වගකීමකින් තමන්ම හෝ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට විමුක්ත වීමට ඉඩ නොදිය යුතු ය.

IV වන උපලේඛනය (2 වන, 11 වන සහ 13 වන වගන්ති)

යුද්ධයක් පවත්නා කාලය තුළ සිවිල් තැනැත්තන් ආරක්ෂා කිරීම පිළිබඳ 1949 අගෝස්තු 12 දිනැති ජිනිවා සම්මුතිය

අදාල විධිවිධාන

IV වන කොටස

සම්මුතිය ක්‍රියාවේ යෙදීම

I වන ඛණ්ඩය

පොදු විධිවිධාන

142 වන වගන්තිය

ආරක්ෂිත තැනැත්තන්ට උපකාර කිරීමෙහි නිරත ආගමික සංවිධාන, සහන සලසන සමිති, හෝ වෙනත් යම් සංවිධානවල නියෝජිතයන්ට, ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව වගබලා ගැනීම සඳහා හෝ වෙනත් යුක්තිසහගත අවශ්‍යතාවයක් නිසා අත්‍යවශ්‍ය ලෙස සිරකරුවන් රඳවාගැනීමේ බලධරයන් සලකන ක්‍රියාමාර්ගවලට යටත්ව එම නියෝජිතයන්ට හෝ ඔවුන්ගේ ප්‍රතිත අනුයෝජිතයන්ට එම ආරක්ෂිත තැනැත්තන් බැලීමට යාම, ඔවුන්ගේ අධ්‍යාපනික, ක්‍රීඩා හා විනෝදාත්මක හෝ ආගමික කාර්ය අරමුණු කරගෙන යම් ප්‍රභවයකින් ලැබුණු සහන සැපයුම් හා ද්‍රව්‍ය ඔවුන් අතර බෙදාදීම සහ ඔවුන් රඳවාගනු ලැබ සිටින ස්ථාන ඇතුළත ඔවුන්ගේ විවේක කාලසීමා ගත කිරීම සංවිධානය කිරීම සඳහා සහාය වීම පිණිස සියලු පහසුකම් එකී බලධරයන් විසින් සැපයිය යුතු ය. එම සමිති හෝ සංවිධාන එම රඳවා ගැනීමේ බලාධිකාරවලට අයත් බලප්‍රදේශය ඇතුළතම හෝ වෙනත් යම් රටක හෝ සංස්ථාපනය කරනු ලැබිය හැකි හෝ ජාත්‍යන්තර අනුලක්ෂණ සහිත සමිති හෝ සංවිධාන විය හැකි ය. රඳවා ගැනීමේ බලාධිකාරය විසින් එම බලාධිකාරයේ දේශසීමා ඇතුළත ස්වකීය අධීක්ෂණය යටතේ යම් සමිතිවල හා සංවිධානවල දූතයන්ට ඒවායේ ක්‍රියාකාරකම් කරගෙන යාමට ඉඩදී තිබේද එම සමිති හා සංවිධාන සංඛ්‍යාව එම බලාධිකාරය විසින් සීමා කරනු ලැබිය හැකි ය ; එසේ වුවද එම සීමා කිරීම සියලු ආරක්ෂිත තැනැත්තන්ට සාර්ථකව හා ප්‍රමාණවත්ව සහන ලැබීමට බාධාවක් නොවීමේ කොන්දේසිය මත විය යුතු ය.

මෙම ක්ෂේත්‍රයෙහි ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයට හිමි විශේෂ තත්ත්වය සැම කල්හිම පිළිගනු ලැබිය යුතු හා ගරුකරනු ලැබිය යුතු ය.

143 වන වගන්තිය

ආරක්ෂක රාජ්‍යවල නියෝජිතයන්ට සහ දූතයන්ට ආරක්ෂිත තැනැත්තන් සිටින සියලු ස්ථානවලට, විශේෂයෙන් ඔවුන් සීමාවාසිකව සිටින, රඳවා තබා සිටින, සහ වැඩෙහි යොදවා සිටින ස්ථානවලට යාමට අවසර තිබිය යුතු ය.

ආරක්ෂිත තැනැත්තන් පරිහරණය කරන සියලු පරිශ්‍රවලට ප්‍රවිෂ්ටවීමට සහ එම ආරක්ෂිත තැනැත්තන් සමග සාක්ෂිකරුවන් නොමැතිව පෞද්ගලිකව හෝ භාෂා පරිවර්තකයන් මගින් සම්මුඛව සාකච්ඡා කිරීමට ඔවුන්ට අවසර තිබිය යුතු ය.

එසේ යෑම් ඊම්, අනිවාර්ය යුධමය අවශ්‍යතාවක හේතුව මත හැර තහනම් නොකළ යුතු අතර එසේ තහනම් කිරීමද සුවිශේෂ හා තාවකාලික ක්‍රියාමාර්ගයක් පමණක් විය යුතු ය. එසේ ගමන් කරන අවස්ථාවලදී ගත කරන කාලය සහ ගමන් කරන වාර ගණන සීමා නොකළ යුතු ය.

එම නියෝජිතයන්ට සහ දූතයන්ට ඔවුන් යාමට රිසි ස්ථාන තෝරා ගැනීමට සම්පූර්ණ නිදහස තිබිය යුතු ය. රඳවා තබා ගැනීම කරන හෝ බලසේනා යොදන රාජ්‍ය, ආරක්ෂක බලාධිකාරය සහ අදාළ අවස්ථාවක් මතු වූ විටක, බැලීමට නියමිත තැනැත්තන්ගේ සම්භව රාජ්‍යය විසින් සීමාවාසිකයන්ගේ ඒක දේශිකයන්ට එම ගමන්වලට සහභාගිවීමට අවසර දීමට එකඟ විය හැකි ය.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ දූතයන් ද ඉහත සඳහන් පරමාධිකාරී බලතල භුක්ති විඳිය යුතු ය. එහි දූතයන්ගේ පත්කිරීම, ඔවුන්ගේ කාර්ය ක්‍රියාත්මක කරන්නේ නම් දේශසීමා ඇතුළත ද එහි පාලනය කරන රාජ්‍යයේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

144 වන වගන්තිය

මෙම සම්මුතියේ මූලධර්ම පිළිබඳව තමතමන්ගේ මුළු මහත් ජනතාව දැනුවත් කිරීම පිණිස, යුද්ධය පවතින කාලය තුළ මෙන්ම සාමය පවතින කාලය තුළ දී ද මෙම සම්මුතියේ භාවය පිළිබඳ දැනීම තමතමන්ගේ රටවල හැකිතාක් පුළුල්ව ව්‍යාප්ත කිරීමට සහ විශේෂයෙන්ම යුධ උපදේශන වැඩසටහන්වල දී හා හැකිනම් සිවිල් උපදේශන වැඩසටහන්වලදී අධ්‍යයනය සඳහා ඇතුළත් කිරීමට, ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව ගිවිස ගනී.

යුද්ධයක් පවත්නා කාලසීමාවල දී යුධ සිරකරුවන් පිළිබඳ වගකීම භාර ගන්නා යම් සිවිල්, යුධ හමුදා, පොලිස් හෝ වෙනත් බලධාරීන් වෙත මෙම සම්මුතියේ වගන්ති තිබිය යුතු අතර, සම්මුතියේ විධිවිධාන පිළිබඳව එම බලධරයන් විශේෂයෙන් උපදෙස් ලබා තිබිය යුතු ය.

145 වන වගන්තිය

ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව විසින් ඔවුනොවුන් අතර සන්නිවේදනය ස්විස් ෆෙඩරල් කවුන්සිලය හරහා පවත්වා ගත යුතු අතර, ගැටුම පවතින අවස්ථාවල දී සම්මුතිය අදාළ කර ගන්නා බවට වගබලා ගැනීම පිණිස වර්තමාන සම්මුතියේ නිල පරිවර්තනය සහ තමන් විසින් උපයෝගී කර ගත හැකි නීතිරීති හා නියෝග හරහා සන්නිවේදනය පවත්වාගත යුතු ය.

146 වන වගන්තිය

මෙම සම්මුතියේ පහත දැක්වෙන වගන්තියේ අර්ථකථනය කර තිබෙන බරපතල උල්ලංඝන කිසිවක් සිදු කරන හෝ සිදු කිරීමට අණ කරන තැනැත්තන් කෙරෙහි සාර්ථක දණ්ඩන පැනවීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථා සම්මත කිරීමට, ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්ව ගිවිසගනී.

එවැනි බරපතල උල්ලංඝන සිදු කළ හෝ සිදු කිරීමට අණකළ තැනැත්තන් සොයා ගැනීමේ සෝදිසි මෙහෙයුම් පැවැත්වීමට, එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය බැඳී සිටින අතර, එම තැනැත්තන්ගේ ජාතිකත්වය කුමක් වුව ද, ඒ තැනැත්තන් තම රජයේ අධිකරණ හමුවට පැමිණවීම එක් එක් ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය විසින් සිදු කරනු ලැබිය යුතු ය. ඒ ඒ ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයේ මනාපය අනුව සහ වෙනත් ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයක් විසින් මුල් බැල්මට පෙනෙන කාරණා ඉදිරිපත් කරන්නේ නම්, එම තැනැත්තන් නඩු විභාගය සඳහා එකී වෙනත් ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට තම රටෙහි ව්‍යවස්ථාවලට අනුකූලව භාර දෙනු ලැබිය හැකි ය.

මෙහි පහත වගන්තියේ අර්ථකථනය කර තිබෙන බරපතල උල්ලංඝන හැර, මේ සම්මුතියේ විධිවිධානවලට පටහැනි සියලු ක්‍රියා මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, එක් එක් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වය විසින් ගනු ලැබිය යුතු ය.

සියලු අවස්ථාගත තත්ත්වයන් හි දී, නිසි නඩුවිභාගයක් ලැබීමේ සහ නිසි විත්තිවාචකයක් දිය හැකි වීමේ ආරක්ෂක ක්‍රියාමාර්ග මගින්, චූදිත තැනැත්තන්ට ප්‍රතිලාභ අත්වන අතර, එම ක්‍රියාමාර්ග, 105 වන වගන්තියේ සහ යුධ සිරකරුවන්ට සැලකීම පිළිබඳ 1949 අගෝස්තු 12 දිනැති ජිනීවා සම්මුතියේ පහත දැක්වෙන වගන්තිවලින් සලසා ඇති ප්‍රතිකර්මවලට වඩා අඩු වාසිදායක නොවිය යුතු ය.

147 වන වගන්තිය

මෙහි පහත සඳහන් කවර හෝ ක්‍රියාවක්, මෙම සම්මුතියෙන් ආරක්ෂිත තැනැත්තන් හෝ දේපළ විෂයයෙහි සිදු කරනු ලැබුවහොත් ඒවා මීට ඉහතින් ඇති වගන්තිය හා සම්බන්ධිත බරපතල උල්ලංඝන වන්නේ ය ; චේතනාන්විත ඝාතනය, වදහිංසා කිරීම හෝ ජීව විද්‍යාත්මක අත්හදා බැලීම් ද ඇතුළත්ව අමානුෂික සැලකිල්ල, ශාරීරිකව හෝ සෞඛ්‍යයට තදබල වේදනා හෝ බරපතල තුවාල චේතනාන්විතව සිදු කිරීම, ආරක්ෂිත තැනැත්තකු නීති විරෝධීව රටින් පිට කිරීම, මාරු කිරීම හෝ නීති විරෝධීව රඳවා තබා ගැනීම, පසම්තුරු රාජ්‍යයක සන්නද්ධ හමුදාවක සේවය කිරීමට ආරක්ෂිත තැනැත්තකුට බල කිරීම හෝ ආරක්ෂිත තැනැත්තකුට මෙම සම්මුතියේ නියමිත සාධාරණ හා විධිමත් නඩු විභාගයක් ලැබීමේ අයිතිවාසිකම චේතනාන්විතව අහිමි කිරීම, ප්‍රාණ ඇපකරුවන් ගැනීම සහ යුධමය අවශ්‍යතා වශයෙන් යුක්ත යුක්ති නොවන හා නීතිවිරෝධීව හා හිතුවක්කාරව විශාල වශයෙන් සිදු කරන දේපළ විනාශය සහ දේපළ අත්පත් කර ගැනීම.

149 වන වගන්තිය

කිසිදු ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයකට ඒ පාර්ශ්වය විසින් හෝ වෙනත් ගිවිසුම්ගත රාජ්‍ය පාර්ශ්වයක් විසින් හෝ දරන්නා වූ වගකීමෙන් තමන්ම හෝ වෙනත් ගිවිසුම්ගත ප්‍රධාන රාජ්‍ය පාර්ශ්වයක් මගින් හෝ විමුක්ත වීමට ඉඩ නොදිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පත්‍රිකා ගැසට් පත්‍රවල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.